10 ශ්‍රේණිය

# නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය

## කාර්මික ආරක්ෂාව



අන්තර්ගතය - ඩී.එම්.එස්.ඒ.දසනායක - කැ/මාව/පින්නවිල ම.ම.වි., රඹුක්කන
සැකසුම - වයි.එම්.ඩී.බී.යාපා- රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය-කහවත්ත

The National e-learning Portal for the General Education

## නිපුණතාව :-

තාක්ෂණික කාර්යයන් සාර්ථකව ඉටු කර ගැනීම සඳහා ආරක්ෂක පූර්වෝපා අනුගමනය කරයි.

## නිපුණතා මට්ටම :-

හදිසි අවස්ථාවක දී ප්‍රථමාධාර ලබා දීමේ නිපුනතාව ප්‍රදර්ශනය කරයි.

## අරමුණ :-

I. හදිසි අනතුරු වළක්වා ගැනීමට අදිටන් කර ගනී.

II. අනතුරකදී ක්‍රියා කළ යුතු ආකාරය අධිෂ්ඨානය කර ගනී.

III. ප්‍රථමාධාර ලබා දීම සඳහා වූ හැකියාව වර්දනය කර ගනී.

IV. වැඩි දුර වෛද්‍ය ප්‍රතාකාර සඳහා යොමු කළයුතු බව වටහා ගනී.

## ඉගෙනුම් ඵල:-

- හදිසි අනතුරකදී වැලැක් වී සිටීම සඳහා විවිධ ක්‍රියා මාර්ග අනුගමනය කරයි.
- මෙහිදී සිහි බුද්ධියෙන් සහ මානසික ඒකාග්‍රතාවයෙන් කටයුතු කිරීමට පෙළඹෙයි.
- ප්‍රථමාධාර ලබා දීම සඳහා වූ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- ඉන් පසු ක්‍රියා කළයුතු ආකාරය ක්‍රියාවට නන්වයි.

## අන්තර්ගතය:-

### පියවර 1 -

තාක්ෂණික කාර්යයන්හි නිරත වන බොහෝ පුද්ගලයන් අනතුරු වලට ලක්වීමේ අවදානමක් ඇත. නොසැලකිලිමත් කම හා නොදැනඅවත් කම මෙයට හේතුවයි.බොහෝ විට කර්මාන්ත ක්ෂේත්‍රෙය් නිරත වන්නන්ගෙන් වැඩි පිරිසක් තරුණ පිරිස් බවත් ඔවුන් අනතුරු පිළබද දැනුවත් නිරීම තුලින් අනතුරු අවම කර ගැනීම සදහා අනතුරු සිදු වූ අවස්ථාවේම ප්‍රථමාධාර ලබා දීම සහ ඉන් අනතුරුව ක්‍රියා කළ යුතු ආකාරය මඟ පෙන්විය යුතුය.

## පියවර II -

හදිසි අනතුරු සිදුවිය හැකි අවස්ථා විමසා බලමු.

1. ස්වභාවික හදිසි අනතුරු
2. විදුලිය මගින් සිදුවන හදිසි අනතුරු
3. යාන්ත්‍රික ක්‍රියා මගින් සිදුවන හදිසි අනතුරු
4. කාර්මිකයන්ගේ නොසැලිකිලිමත් බව නිසා සිදුවන අනතුරු













කර්මාන්ත ශාලාවක කටයුතු කිරීමේදී අනතුරු විවිධාකාරයෙන් සිදුවිය හැක.

- යන්ත්‍ර මගින් .
- විදුලිය මගින් .
- ලිහිසි ද්‍රව්‍ය බිම දැමීමෙන්.
- කාර්මිකයන්ගේ වැරදි ක්‍රියා මගින් .

මෙහිදී යන්ත්‍ර මගින් සිදුවන සිදුවන අනතුරු පිළිබඳව සොයා බැලීමේ දී විශේෂයෙන් සඳහන් කළහැකි යන්ත්‍ර මොනවාදැයි බලමු.

1. බහු කාර්ය ලී වැඩ යන්ත්‍රය.
2. දුනු හැඩගැසීමේ යන්ත්‍රය.
3. ලේත් මැෂින්
4. පැස්සුම් යන්ත්‍ර මගින්.
5. විදුලි අත් කියත් මගින්
6. ග්‍රයින්ඩර් යන්ත්‍ර මගින්.

මේවායින් වැඩ කිරීමේදී නිවරදි ආකාරයට ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන්ද නොසැලිකිලිමත් වීම තුලින්ද හදිසි අනතුරු සිදු විය හැක. විශෙෂයෙන් සැලැකිලිමත් විය යුතු වන්නේ චලිත කොටස් ආවරණය නොකර ඇති අවස්ථාවලදීය.

## පියවර III -

### විදුලිය මගින් සිදුවන අනතුරු පිළිබඳව සොයා බලමු.

විශේෂයෙන් පළුදු වූ පරිවාරක , විවෘත සන්නායක, කැඩුනු විදුලි පේනු,සහ එම ස්ථාන වල තෙත ගතිය සහිත වීම මගින් විදුලි අනතුරු සිදු විය හැක. අනතුරු දායක තත්වයන් දුටු වහාම ඒවා නිවැරදි කිරීමට යුහුසුළු විය යුතුය. විදුලි උපකරණ භාවිතා කිරීමේදී නිවරදි ක්‍රියා අනුගමනය කළ යුතුය.

❖ ලිහිසි ද්‍රව්‍ය මගින් කර්මාන්ත ශාලා අපවිත්‍ර වීම.

ලිහිසි ද්‍රව්‍ය මගින් කර්මාන්ත ශාලා අපවිත්‍ර වීම මගින් කාර්මිකයන් ඔබ මොබ ඇවිදීමේදී අනතුරු සිදු වීමට පිළවෙන. ලිස්සා යාම මගින් වැටීම සිදු වී යන්ත්‍ර සූත්‍ර වල ගැටීමෙන් බරපතල අනතුරු සිදු විය හැක.

❖ කාර්මිකයන්ගේ වැරදි ක්‍රියා මගින්

කාර්මිකයන් කර්මාන්ත ශාලාව තුල වැඩ ඇදුම් පැළඳ නොසිට සටීම,වැරදි යන්ත්‍ර ක්‍රියාකාරීත්වය, වැරදි ආකාරයට විදුලි කෙවෙනි භාවිතා කිරීම නිසා අනතුරු සිදු විය හැක.

❖ ප්‍රථමාධාර දීම සදහා හදිසි අනතුරු සිදු වීමෙන් ශරීරයට සිදුවිය හැකි හානි පිළිබදව දැන සිටිය යුතුය. එනම්,

- විදුලි සැර වැදීම.
- අස්ථි භග්න වීම.
- රුධිර වහනය.
- පිළිස්සීම.
- මරණය.

❖ විදුලියෙන් සිදුවන අනතුරු දෙයාකාරයකින් සිදු විය හැකිය.

1) විදුලි සැර වැදීම.

2) විදුලිගිනි ඇති වීම.

❖ විදුලි සැර වැදුනු අයෙකුට ප්‍රථමාධාර දෙන්නේ කෙසේද.

1. පී.වී.සී බටයක් හෝ වියලි ලීයක් ආධාරයෙන් විදුලි සැපයුම සිව්චයෙන් විසන්ධි කළ යුතුය.
2. විදුලි සැර වැදුන පුද්ගලයෙකු ගේ ඇදුම ලිහිල් කර තැබිය යුතුය.
3. සිහිසුන්ව හුස්ම නොවැටෙ නම් කෘතිම ස්වසනය ලබා දිය යුතුය.



❖ අස්ථි භග්න වූ අයට ප්‍රථමාධාර දී ඒ අවස්ථාවේ සිදු වී ඇති භග්න වීම අනුව අනුගත විය යුතුය. එමෙන්ම රුධිර වහනය සිදුවන අවස්ථාවක නම් කැපුම් තුවාලයක් වේ නම් තුවාලයෙන් ලේ වහනය නොවන පරිදි තද කර වෙලා හැකි ඉක්මනින් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කළ යුතු ය.

❖ පිළිස්සීම :- මෙයින් අදහස් කරන්නේ උෂ්ණත්වයකට හෝ රසායනික ද්‍රව්‍යක් මගින් ශරීරයේ ඉන්ද්‍රියන්ට හා අවයව වලට සිදුවන හානි වේ.

පිළිස්සීම දෙයාකාරයෙන් සිදු වේ එනම් වියළි පිළිස්සීම සහ තෙත පිළිස්සීම.

මෙම කුමන ක්‍රමයෙන් අනතුරක් සිදු වුවත් පිළිස්සුන ස්ථානය විනාඩි 20ක් පමණ ජලයෙන් තෙමීම සිදු කොට , පිරිසිදු රෙදි කඩකින් වසා වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කළ යුතුය.

## පියවර IV –

## ප්‍රථමාධාර දෙන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග

1. මෙම කාර්යය පිළිබඳව දැනුවත් වී සිටීම.
2. නායකත්වය ගැනීමේ හැකියාව.
3. කාර්ය ශූර බව.
4. තැනට සුදුසු නුවන.
5. රෝගීන් පිළිකුල් නොකිරීම මානව දයාව.
6. ඉවසිලිවන්ත බව.

මෙම ගුණාංග වලින් සමන්විත වන පුද්ගලයෙකු විසින් ප්‍රථමාධාර දීමෙන් රෝගීන්ට යම් සහනයක් ලබා දිය හැකිය.

## සාරාංශය.

කර්මාන්ත ශාලාවක් තුල මෙන්ම යම් ස්ථානයක් තුල හදිසි අනතුරක් සිදු වීම වළක්වා ගැනීම සහ අනතුරක් ක්‍රියාත්මක වීමෙන් සිදුවන දේපල හානි හා ජීවිත හානි අවම කර ගැනීමට හැකි වීමෙන් සමාජයට යම් මෙහෙවරක් ඉටු කිරීම මෙම පාඩම අධ්‍යනය කිරීම මගින් බලාපොරොත්තු වේ.

1. ප්‍රථමාධර දීමේ පරමාර්ථ වශයෙන් රෝගියාගේ .
   - I. බිය දුරු කිරීම.
   - ii.රෝගියාගේ ජීවිතය බේරා ගැනීම.
   - iii. රෝගී තත්වය උස්සන්න වීම වැළැක් වීම අනතුරු ආබාධ අවම කර ගැනීම.
   - iv. දෙවනුව ලබා දෙන නිසි ප්‍රතිකාර වලට පහසු වීම.

2. ප්‍රථමාධාර දෙන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග.
3. ප්‍රථමධාර පෙට්ටියක තිබිය යුතු උපාංග.

ආදිය සාරාංශ වශයෙන් දැක්විය හැක.